**කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ**

**සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021**

මෙම දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ 2021.03.31 දිනට පවතින සහකාර කම්කරු කොමසාරිස් තනතුරුවල පුරප්පාඩු 11 ක් පිරවීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ කම්කරු නිලධාරීන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග සංවිධාන ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021'' යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. තවද විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2021.11.30 දින වේ. මෙම විභාගය 2022 පෙබරවාරි මස කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

**සටහන** : අයදුම්පත හෝ ඊ සම්බන්ධිත ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත විභාගය සමත් වූ අයදුම්කරුවන් වෙනුවෙන් පමණක් සේවා කාලය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර ලිඛිත විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

**02. වැටුප් පරිමාණය:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2016 වැටුප් කාණ්ඩය අනුව මෙම තනතුරට රු. 47,615- 10x1,335 - 8x1,630 - 17x2,170 - රු.110,895/=ක මාසික වැටුප් පරිමාණයක් හිමි වේ.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසිː**

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් එක් අවුරුදු වැඩ බැලීමේ කාල සීමාවකට යටත්වේ.

iii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට අනුශංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත්වේ.

**04. සුදුසුකම්ː**

| | | |
|---|---|---|
| 4.1. අධ්‍යාපන සුදුසුකම් | : | I ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් අතුරින් බඳවා ගන්නා බැවින් අදාළ නොවේ. |
| 4.2. වෘත්තීය සුදුසුකම් | : | අදාළ නොවේ. |
| 4.3. පළපුරුද්ද | : | I ශ්‍රේණියේ කම්කරු නිලධාරියකු වීම සහ කම්කරු නිලධාරී තනතුරේ වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

**05. කායික සුදුසුකම්ː**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතුය.

**06. වයස් සීමාවː**

I වන ශ්‍රේණියේ කම්කරු නිලධාරීන් අතුරින් බඳවා ගන්නා බැවින් වයස් සීමාවක් බලපානු නොලැබේ.

**07. වෙනත් සුදුසුකම්ː**

i. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. සෑම අයදුම්කරුවකුම කම්කරු නිලධාරී තනතුරේ ස්ථිර කර තිබිය යුතුය.

iv. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක කාලසීමාව තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් ලබා තිබීම.

v. නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කර තිබීම.

vi. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

vii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

**8. 8.1 ලිඛිත විභාගය**

8.1.1 මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| | විෂය | කාලය (පැය) | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | කම්කරු නීති | 03 | 100 | 40 |
| 02. | සාමාන්‍ය බුද්ධිය | 01 | 100 | 40 |
| 03. | කළමනාකරණ අභියෝගශීලීතාව | 02 | 100 | 40 |

8.1.2 විෂය නිර්දේශය :

| | විෂය | විෂය නිර්දේශය |
|---|---|---|
| 01. | කම්කරු නීති | එය පහත සඳහන් අණපනත් අළලා සකස්වනු ඇත.<br><br>1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනත<br>1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත<br>1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත<br>1971 අංක 45 දරන සේවය අවසන් කිරීමේ පනත<br>1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත<br>1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත<br>1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත<br>1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත<br>1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනත<br>1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත<br>1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනත<br>1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත |
| 02. | සාමාන්‍ය බුද්ධිය | පද, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 03. | කළමනාකරණ අභියෝගශීලීතාව | ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය, ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවන් ඔහුට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් නිර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. |

## 8.2 සම්මුඛ පරීක්ෂණය

8.2.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අතිරේක පළපුරුද්ද<br><br>මෙම නිවේදනයේ 4.3 උපවගන්තියෙහි සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කළ දින සිට අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය දක්වා ගණන් බැලෙන අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2019 අනුව ලකුණු පිරිනැමෙනු ඇත. එම චක්‍රලේඛයේ විධිවිධාන අනුව උපරිම අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත අයදුම්කරුට උපරිම ලකුණු ලබා දී සෙසු අයදුම්කරුවන්ගේ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට ඊට සමානුපාතික ලකුණු පිරිනමනු ලැබේ. | 100 | අදාළ නොවේ |
| | එකතුව | 100 | |

ලිඛිත විභාගය සමත් වූ අයදුම්කරුවන් පමණක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සාමාන්‍ය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් ලබයි.

ලිඛිත විභාගයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

**සැලකිය යුතුයි :**

සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

8.2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: (ලකුණු ලබා දෙනු නොලැබේ)

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම.

09. **විභාග කොන්දේසි**

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දක්වෙන විභාග මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනටම පෙනී සිටිය යුතුය.

II. විභාග ගාස්තුව රු. 1200.00කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්/දිස්ත්‍රික්/ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත, එහි එක් දාරයක් මගින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

IV. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන

ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

V. අයදුම්පත සෙ.මී. 22X29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු අතර, අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමුවන පිටුවට ද අංක 08 සිට 11.5 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවට ද අංක 12 සිට 14 වන තෙක් ශීර්ෂ තුන්වන පිටුවට ද ඉතිරිය 4 පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

තව ද සම්පූර්ණ කරනු ලබන අයදුම්පත විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව සකසන්න.

VI. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා රීට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්පත ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත් පත්වල නිවේදනයක් පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තම ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතුවේ.

VIII. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

IX. **අපේක්ෂකයාගේ අනන්‍යතාව:** විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී

ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

X. සැලකිය යුතුයි:

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(iii) සෑම අයදුම්කරුවකුම තම අයදුම්පත කම්කරු කොමසාරිස් ජනරාල් මාර්ගයෙන් විභාග කොමසාරිස් ජනරාල් වෙත යොමුකළ යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වේ. අයදුම්කරු තම අත්සන තමා සේවය කරන අංශයේ/ කාර්යාලයේ ප්‍රධානියා ලවා සහතික කරවා ගත යුතුය.

**10.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා 2013.03.07 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියට මින්මතු කෙරෙන සංශෝධනයන් ද මෙම තනතුර සඳහා අදාළ වනු ඇත.

**11.** මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තීරණ ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

**12.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල නිවේදනය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

..............................

**එම් පී ඩී යූ කේ මාපා පතිරණ**

**ලේකම්**

කම්කරු අමාත්‍යාංශය

දිනය - 2021.11.01

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2021

**PUBLIC SERVICE COMMISSION**

**LIMITED COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO THE POST OF ASSISTANT COMMISSIONER OF LABOUR (DEPARTMENTAL) EXECUTIVE SERVICE CATEGORY GRADE III IN THE DEPARTMENT OF LABOUR – 2021**

01 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:

සිංහල 2

දෙමළ 3

ඉංග්‍රීසි 4

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

02. පෞද්ගලික තොරතුරු

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ........................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ ( PERERA H.A.L.S)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

........................................

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................

........................................

03. ලිපිනය

3.1 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

........................................

........................................

3.2 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):........................................

........................................

3.3 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):........................................

........................................

04. ස්ත්‍රී/පුරුෂභාවය : (පුරුෂ-0, ස්ත්‍රී-1)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. ජංගම දුරකථන අංකය :

07. විවාහක/අවිවාහක බව : (අවිවාහක-1,විවාහක-2)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. ජන වර්ගය : (සිංහල-1, දෙමළ-2, ඉන්දිය දෙමළ-3, මුස්ලිම්-4, වෙනත්-5 (අදාළ අංකය කොටුව තුළ ලියන්න) [ ]

09. 9.1 උපන් දිනය : වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

9.2 2021.11.30 දිනට වයස : අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

10. 10.1 II වන ශ්‍රේණියේ කම්කරු නිලධාරී තනතුරට පත්වූ දිනය :

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

10.2 I වන ශ්‍රේණියේ කම්කරු නිලධාරී තනතුරට පත්වූ දිනය :

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

10.3 2021.11.30 දිනට කම්කරු නිලධාරී I වන ශ්‍රේණියේ සේවා කාලය :

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

10.4 2021.11.30 දිනට කම්කරු නිලධාරී තනතුරෙහි මුළු සේවා කාලය :

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

10.5 2021.11.30 දිනට කම්කරු නිලධාරී තනතුරේ වසර 10ක සක්‍රීය සහ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද?.....................................................................

10.6 2021.11.30 දිනට පූර්වාසන්න වසර 05ක වැටුප් වර්ධක උපයාගෙන තිබේද?.................................

10.7 2021.11.30 දිනට පූර්වාසන්න වසර 05ක කාලය තුළ අවවාද කිරීම් හැර වෙනත් දඬුවම් ලබා තිබේ නම්

විස්තර:..................................................................................................

..........................................................................................................

11. සාමර්ථ්‍යයක් ලැබී ඇති ඉහළම විභාග :

උපාධිධාරියකු නම්

11.1 ලබාගන්නා ලද උපාධිය - ...................................................

11.2 විශ්වවිද්‍යාලය/ ආයතනය - ...................................................

11.3 උපාධිය ලැබූ දිනය - ...................................................

11.4 උපාධිය වලංගු දිනය - ...................................................

11.5 විභාගයට පෙනී සිටි මාධ්‍යය - ...................................................

12. විභාග ගාස්තු ගෙවීම

ගෙවූ මුදල රු.………………

ගෙවන ලද කාර්යාලය : ………………………………

ගෙවූ දිනය : ……………………………

ලදුපත් අංකය : ………………………………

| |
|---|
| ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |

13. අයදුම්කරුගේ ප්‍රකාශය :

සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ නිවේදනයේ 4.3 ඡේදයට අනුව 2021.11.30 දිනට වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

මෙම අයදුම්පතේ සපයා ඇති විස්තර සත්‍ය බව ද නිවැරදි බව ද මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් මා මෙම තනතුරට නුසුදුසු වීමට ද මෙම තනතුරට මා පත්කර ගැනීමෙන් පසුව එම වරද දැනගැනීමට ලැබුනහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

දිනය …………………………… ……………………………………

අයදුම්කරුගේ අත්සන

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………………………………………… (අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත්, …………………… දින ඔහුගේ /ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

දිනය: ………………………… ……………………………………

(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ………………………………………………

තනතුර: ……………………………………

ලිපිනය: ……………………………………

(නිල මුද්‍රාවකින් සහතික කළ යුතුයි.)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුව අනුව)

මගේ අංකය : ...............

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................... මහතා/මහත්මිය/මෙනවිය................................. තනතුර දරන නිලධාරියකු/නිලධාරිනියක බවත්, ඔහු/ඇය ..................... දින සිට මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින බවත්, ඔහු/ඇය සම්බන්ධයෙන් මේ වන විට විනයානුකූලව පියවර ගැනීමක් පවතින/නොපවතින බවත්, ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ලදුපත අලවා ඇති බවත් සහතික කරන අතර අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය .................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම : .........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන : .......................................

නිල නාමය : .................................

(නිල මුද්‍රාව)